# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2417/15 - 2024 දෙසැම්බර් මස 31 වැනි අඟහරුවාදා - 2024.12.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්.ඩී.බී. 3/2013 (ii)

**1971 අංක 52 දරන වෙළඳ නැව් පනත**

1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 139 වන වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 321 වන වගන්තිය යටතේ වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

**බිමල් නිරෝෂන් රත්නායක,**
ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය

2024 දෙසැම්බර් මස 30 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. (1) මේ නියෝග 2024 අංක 2 දරන වෙළඳ නැව් (ජල තීරයන් වර්ගීකරණය කිරීමේ) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) මේ නියෝග 2024 දෙසැම්බර් 31 දින අංක 2417/16 දරන *ගැසට්* පත්‍රයේ පළ කරන ලද 2024 වෙළෙඳ නැව් (යාත්‍රා වර්ගීකරණය කිරීමේ සහ සහතික කිරීමේ) නියෝගවල 2 වන නියෝගයෙහි වර්ගීකරණය කර ඇති පරිදි සියලු යාත්‍රා කාණ්ඩවලට අදාළ විය යුතු ය.

1A - PG 6974 — 05 (2025/01)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2. 1971 අංක 52 දරන වෙළඳ නැව් පනත අදාළ කර ගැනීමේ කාර්ය සඳහා, ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ යාත්‍රා ක්‍රියාත්මක විය යුතු ජල තීරයන්, මේ වර්ගීකරණයන් මගින් අර්ථ දක්වනු කරනු ලැබේ.

3. ශ්‍රී ලංකාවේ ලියාපදිංචි යාත්‍රා ක්‍රියාත්මක විය යුතු ජල තීරයන් පහත දැක්වෙන පරිදි වර්ගීකරණය කරනු ලැබේ:-

(*අ*) මුහුදු ගමන් - ජාත්‍යන්තර;

(*ආ*) වෙරළබඩ ජල තීරය;

(*ඇ*) අනාවෘත ජල තීරය; සහ

(*ඈ*) අභ්‍යන්තර ජල තීරය.

4. ඉහත 3 වන නියෝගය පරිදි වර්ගීකරණය කර ඇති මුහුදු ප්‍රදේශ, ක්‍රියාත්මක වනු ලබන ප්‍රදේශවලට අනුව තවදුරටත් මෙහි I වන, II වන සහ III වන උපලේඛනවල නිශ්චිතව දක්වා ඇති පරිදි නිරූපණය කරනු ලැබේ :-

| | | |
|---|---|---|
| (අ) | ප්‍රදේශ කාණ්ඩය O | - සීමා නොකළ මුහුදු ගමන් සේවය; |
| (ආ) | ප්‍රදේශ කාණ්ඩය OR | - සීමා කළ මුහුදු ගමන් සේවය, නම් කළ පිටත් වීමේ ස්ථානයක සිට නාවික සැතපුම් 200ක් දක්වා මුහුද දෙසට; |
| (ඇ) | ප්‍රදේශ කාණ්ඩය 1 | - ආරක්ෂිත නැව් තොටක සිට නාවික සැතපුම් 150ක් දක්වා මුහුදේ සහ මුහුදු තීරයේ සිට නාවික සැතපුම් 24 ක් ඇතුළත; |
| (ඈ) | ප්‍රදේශ කාණ්ඩය 2 | - ආරක්ෂිත නැව් තොටක සිට නාවික සැතපුම් 60ක් දක්වා මුහුදේ සහ මුහුදු තීරයේ සිට නාවික සැතපුම් 24ක් ඇතුළත; |
| (ඉ) | ප්‍රදේශ කාණ්ඩය 3 | - ආරක්ෂිත නැව් තොටක සිට නාවික සැතපුම් 30ක් දක්වා මුහුදේ සහ මුහුදු තීරයේ සිට නාවික සැතපුම් 24ක් ඇතුළත; |
| (ඊ) | ප්‍රදේශ කාණ්ඩය 4 | - යාත්‍රාවල සැලසුම් වර්ගයට අනුරූපී මුහුදු තත්ත්වයන් හි දී නම් කළ පිටත්වීමේ ස්ථානයක සිට නාවික සැතපුම් 20ක් දක්වා මුහුදේ, මුහුදු තීරයේ සිට නාවික සැතපුම් 12ක් ඇතුළත ක්‍රියාත්මක වන; |
| (උ) | ප්‍රදේශ කාණ්ඩය 5 | - යාත්‍රාවල සැලසුම් වර්ගයට අනුරූපී මුහුදු තත්ත්වයන් හි දී නම් කළ පිටත්වීමේ ස්ථානයක සිට නාවික සැතපුම් 12ක් දක්වා මුහුදේ, මුහුදු තීරයේ සිට නාවික සැතපුම් 12ක් ඇතුළත ක්‍රියාත්මක වන; |
| (ඌ) | ප්‍රදේශ කාණ්ඩය 6 | - ඕනෑම කාලයක දී සැලකිය යුතු රළ උස මීටර් 2.0 ඉක්මවා යාමක් අපේක්ෂා කළ නොහැකි උදම් ගංගා, මෝයවල්, කලපු, මුහුදු බොකු සහ මුහුදු තුඩු; |

(එ) ප්‍රදේශ කාණ්ඩය 7 - ඕනෑම කාලයක දී සැලකිය යුතු රළ උස මීටර් 1.2 ඉක්මවා යාමක් අපේක්ෂා කළ නොහැකි උදම් ගංගා, මෝයවල්, කලපු, මුහුදු බොකු සහ මුහුදු තුඩු සහ විශාල ගැඹුරු අභ්‍යන්තර විල්;

(ඒ) ප්‍රදේශ කාණ්ඩය 8 - ජලයේ ගැඹුර සාමාන්‍යයෙන් මීටර් 1.5ක් හෝ ඊට වැඩි වන සහ ඕනෑම කාලයක දී සැලකිය යුතු රළ උස මීටර් 0.6 ඉක්මවා යාමක් අපේක්ෂා කළ නොහැකි පුළුල් ගංගා, ඇළවල් සහ කුඩා අභ්‍යන්තර විල්; සහ

(ඔ) ප්‍රදේශ කාණ්ඩය 9 - ජලයේ ගැඹුර සාමාන්‍යයෙන් මීටර් 1.5ට අඩු පටු ගංගා සහ ඇළවල්.

5. මේ නියෝගවල -

"සීමා රේඛාව" යන්නෙන්, නිල වශයෙන් පිළිගත් විශාල පරිමාණයේ සිතියම් මත ලකුණු කර ඇති වෙරළ තීරය සමග පවතින පහත් ජල තීරය අදහස් වේ. වෙරළ තීරයන් ඔස්සේ වෙරළාසන්න දූපත් සම්බන්ධ කරන, ගංගා මෝය ඔස්සේ හෝ මුහුදු බොකු ඔස්සේ ඇති රේඛා ඍජු සීමා රේඛාවන් ලෙස අර්ථ දැක්වේ;

"බෝට්ටුව" යන්නෙන්, දිගින් මීටර් 24කට අඩු යාත්‍රාවක්, හෝ දළ ටොන් බර 150ට අඩු යාත්‍රාවක් අදහස් වේ. බෝට්ටුව, බෝට්ටුවක්, වායු පිරවූ වාහනයක්, රුවල් බෝට්ටුවක්, සුළං පිරවිය හැකි බෝට්ටුවක් විය හැකි ය;

"වෙරළබඩ ජල තීරය" යන්නෙන්, අනාවෘත ජල තීරය හැර සීමා රේඛාවේ මුහුදට මුහුණලා ඇති සහ සීමා රේඛාවේ සිට නාවික සැතපුම් 24ක් දක්වා විහිදෙන සියලු ජල තීරයන් අදහස් වේ;

"රුවල් නැව" යන්නට නැව යන්නෙහි අර්ථයම ඇත;

"අනාවෘත ජලතීරය" යන්නෙන්, සීමා රේඛාවේ සිට නාවික සැතපුම් 12ක් දක්වා දේශීය ජල තීරය මනිනු ලබන සීමා රේඛාවේ මුහුදට මුහුණලා ඇති සියලු ජල තීරයන් අදහස් වේ;

"අභ්‍යන්තර ජල තීරය" යන්නෙන්, දේශීය ජල තීරය මනිනු ලබන සීමා රේඛාවේ භූමියට මුහුණලා ඇති සියලු ජල තීරයන් සහ ජලමාර්ග අදහස් වේ;

"දිග" යන්නෙන්, නැව්තලයේ ඉහළ සිට මනිනු ලබන අඩුම හැඩ කළ ගැඹුරින් සියයට 85ක දී පවතින ජල මාර්ගයක මුළු දිගින් සියයට 96ක් හෝ එම ජල මාර්ගයේ කඳේ ඉදිරිපස සිට සුක්කානමේ අක්ෂය දක්වා දිග යන දෙකෙන් වඩා වැඩි දිග අදහස් වේ. නැව්තලයේ ආනතියක් සහිතව සැලසුම් කර ඇති බෝට්ටුවක, මෙම දිග මනිනු ලබන ජල සීමාව සැලසුමේ ජල මාර්ගයට සමාන්තර විය යුතු ය;

"නාවික සැතපුම" යන්නෙන්, මීටර් 1852 ක් අදහස් වේ;

"නම් කරන ලද පිටත් වීමේ ස්ථානය" යන්නෙන්, බෝට්ටු සහතිකයේ නිශ්චිතව දක්වා ඇති පරිදි, බෝට්ටුව පිටත් වීම සඳහා නම් කරන ලද ස්ථානය අදහස් වේ. මෙම ස්ථානය අභ්‍යන්තර ජල තීරය තුළ ඇති අවස්ථාවක දී, එය සීමා රේඛාවේ මුහුදට මුහුණලා ඇති සීමාව ලෙස සළකනු ලැබේ;

"සම්මුතිය නොවන යාත්‍රා" යන්නෙන්, සංවිධාන සම්මුතීන් අදාළ නොවන යාත්‍රා සහ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, යාත්‍රාවේ දළ ටොන් බර හේතුවෙන් අදාළ වන අදාළ සංවිධාන සම්මුතීන්ගෙන් නිදහස් කිරීමක් ප්‍රදානය කර ඇති අභ්‍යන්තර මුහුදු ගමන්වල පමණක් යෙදෙන යාත්‍රා අදහස් වේ. වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිදහස් කිරීම් ප්‍රදානය කරනු ලැබ ඇත්නම් මිස යාත්‍රාවේ දළ

ටොන් බර හෝ මෙහෙයුම් සිදු කරනු ලබන ප්‍රදේශය හේතුවෙන් ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධාන සම්මුතීන් හි කොටස් ආදාළ වන අවස්ථාවක දී, ඒවා අදාළ විය යුතු ය;

"ආරක්ෂිත නැව්තොට" යන්නෙන්, බෝට්ටුවක් විසින් එහි සුරක්ෂිතභාවයට අනතුරක් ඇති වීමට ඉඩ ඇති තත්ත්වයන් යටතේ දී රැකවරණය සහිත ස්ථානයක් ලෙස භාවිතා කරනු ලැබිය හැකි යම් ස්වභාවික හෝ කෘතිම ආරක්ෂිත ප්‍රදේශයක් අදහස් වේ. මෙය බෝට්ටුව සේවයේ යෙදූ නැවක් හෝ විකල්ප මව් නැවක් විය හැකි ය;

"මුහුදු ගමන" යන්නෙන්, අනාවෘත ජල තීරය සහ වෙරළබඩ ජල තීරය හැර සීමා රේඛාවේ මුහුදට මුහුණලා ඇති පැත්තේ පවතින සියලු ජල තීරයන් අදහස් වේ;

"නැව" යන්නෙන්, දිගින් මීටර් 24ට වැඩි ජලවාහක යාත්‍රාවක් හෝ දළ ටොන් බර 150ට වැඩි යාත්‍රාවක් අදහස් වේ;

"යාත්‍රාව" යන්නෙන්, මේ නියෝගවල අර්ථ දක්වා ඇති පරිදි නැවක් හෝ බෝට්ටුවක් අදහස් වේ.

## I වන උපලේඛනය

(4 වන නියෝගය)

පහත දැක්වෙන වගුවෙන්, මීටර් 24ට අඩු සම්මුතීය නොවන යාත්‍රා සඳහා ජල මාර්ග වර්ගීකරණය සහ ඊට අදාළ ක්‍රියාත්මක වනු ලබන ප්‍රදේශ සහ සැලසුම් වර්ගය, තාක්ෂණික කේතවලින් නිශ්චිතව දක්වා ඇති පරිදි, කෙටි අනුරූපණයක් ලබා දෙනු ලැබේ.


| *ජල මාර්ග වර්ගීකරණය* | *ක්‍රියාත්මක වනු ලබන ප්‍රදේශ* | *සැලසුම් කාණ්ඩය* |
|---|---|---|
| මුහුදු ගමන් - ජාත්‍යන්තර (සීමා නොකළ) | ප්‍රදේශ කාණ්ඩය O | A |
| මුහුදු ගමන් - සීමා කළ | OR වන ප්‍රදේශ කාණ්ඩය | A |
| වෙරළබඩ ජල තීරය | 1 වන ප්‍රදේශ කාණ්ඩය | A |
| | 2 වන ප්‍රදේශ කාණ්ඩය | B |
| | 3 වන ප්‍රදේශ කාණ්ඩය | B |
| අනාවෘත ජල තීරය | 4 වන ප්‍රදේශ කාණ්ඩය | C |
| | 5 වන ප්‍රදේශ කාණ්ඩය | C |
| අභ්‍යන්තර ජල තීරය | 6 වන ප්‍රදේශ කාණ්ඩය | C |
| | 7 වන ප්‍රදේශ කාණ්ඩය | C |
| | 8 වන ප්‍රදේශ කාණ්ඩය | D |
| | 9 වන ප්‍රදේශ කාණ්ඩය | D |

පහත වගුවෙන් තාක්ෂණික කේතවලින් නිශ්චිතව දක්වා ඇති පරිදි ක්‍රියාත්මක වනු ලබන ප්‍රදේශ මත ජල මාර්ග වර්ගීකරණය සහ මීටර් 24 ට අඩු සම්මුතීය නොවන යාත්‍රා සඳහා සැලසුම් වර්ගය පිළිබඳ කෙටි සිතියම්කරණයක් ලබා දෙනු ලැබේ.

**II වන උපලේඛනය**

(4 වන නියෝගය)


**වර්ගීකරණය නිදර්ශනය සහිත ශ්‍රී ලංකා සිතියම (සීමාරේඛාව ආසන්න වශයෙන් දක්වා ඇත)**



**III වන උපලේඛනය**

(4 වන නියෝගය)

කොළඹ නගරය නම් කළ පිටත් වීමේ ස්ථානය ලෙස උපකල්පනය කරමින් නිදර්ශන ලෙස 4 වන හෝ 5 වන ප්‍රදේශ කාණ්ඩයන් පහත නිරූපණය කර ඇති පරිදි වේ.




1 වන, 2 වන සහ 3 වන ප්‍රදේශ කාණ්ඩයේ නාවික සැතපුම් 24 සීමාව ඇතුළත මුහුදු ගමන් සඳහා වන නමුත්, ආරක්ෂිත නැව්තොටක සිට පිළිවෙළින් නාවික සැතපුම් 150, නාවික සැතපුම් 60 සහ නාවික සැතපුම් 30 ඇතුළත වේ.

OR වන ප්‍රදේශ කාණ්ඩය නම් කළ පිටත් වීමේ ස්ථානයක සිට නාවික සැතපුම් 200ක අරයක් ඇතුළත මුහුදු ගමන් සඳහා වේ.

EOG - 01-0010

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.